බුදුසරණ
Buddhist Era 2547 Wap Second Quarter - Saturday, October 18,2003



අනෝමා ගංතෙරින් එතෙරවූ සිදුහත් කුමරු සිය කෙස්වැටිය කපා දමා සසර දුක නිවනු පිණිසගමන් අරඹන මොහොත

## ❊ සියලු සම්පත් හැර දමා බුදුසරණ සොයා ආවා

– බුද්ධිකා බ්‍රාහ්මණගේ

'වයි අයි බිකේම් අ බුඩිස්ට්' (Why I became a buddhist) විශේෂාංගය යටතේ ජර්මනියේ පැවැති යුද වාතාවරණය තුළ ජීවත් වී – ඉන් පීඩනයට පත්ව ලද අත්දැකීම් ඔස්සේ – බුදුදහමේ පුළුල් ජීවන දැක්ම තුළින් සැනසීම ලද ජර්මන් ජාතික කාන්තාවක් පිළිබඳ ලියැවුණු ලිපියකි.

## ❊ මහා පවාරණයෙන් පසු එළඹි කඨින චීවර මාසය

– නාලන්දේ විමලවංශ හිමි

වස් විසීම නම් වූ ඉපැරැණි ශාසනික සම්ප්‍රදයානුකූලව – වස් පවාරණය කිරීම සහ කඨින චීවර පූජා පැවැත්වෙන මාසය නිමිති කරගෙන – ඒ පිළිබඳ සිරිත් – විරිත් සහ ඓතිහාසික තොරතුරු ඇතුළත් කොට ලියැවුණු ලිපියකි.

## ❊ බොදු දැක්මෙන් අප දකින සාමය – සංවරය හා සදාචාරය

– ඇහැටුගස්වැවේ සුධම්මාලංකාර හිමි

සාමය – සංවරය හා සදචාරය සමාජය තුළ වර්ධනය කිරීමෙහිලා බෞද්ධ ජීවන දර්ශනය උපයෝගී වන ආකාරය. බුදු දහම පිළිබඳ අවබෝධය සමඟ සාමය – සංවරය හා සදචාරය සමාජය තුළ ස්ථාපිත වීමෙහි ප්‍රායෝගිකත්වය.

## ❊ හරවත් දෙසුමට වඩා ගුණවත් දිවිය අගෙයි

– දිවියාගහ යසස්සි නා හිමි

'සාර්ථක ජීවිතයකට ධම්මපදයෙන්' විශේෂාංගය යටතේ පුද්ගලයකු තුළ යහපත් ගුණාංග වර්ධනය වීමෙහි අවශ්‍යතාව. ධර්ම දේශනාව හා අනුශාසනාවට වඩා – ගුණවත් හා ආදර්ශවත් ජීවිතයක් ගත කිරීමේ වැදගත්කම හා ඵලදයක බව.

## ❊ කේන්ති නොගැනීම

– උඩුවේ ධම්මාලෝක හිමි

'දියුණුවේ දෙරටු' විශේෂාංගය යටතේ ද්වේෂය ඇතිවන හේතු සහ එහි අහිතකර ප්‍රතිඵල සරල බසින් පහදදීමට කරන උත්සාහයක් හැටියට මෙම ලිපිය හැඳින්විය හැකිය.

## ❊ ආර්ථික අපහසුතාවලින් පෙළෙන දරුවන් වෙනුවෙන් කැපවන අනුරපුර බෞද්ධ ළමා සංවර්ධන පදනම

– චන්ද්‍රදාස මලවරආරච්චි

බෞද්ධ ළමා පරපුර වෙනුවෙන් සුවිශේෂ සේවා රැසක් ඉටුකරන පුණ්‍යායතනයක් පිළිබඳ තොරතුරු මෙම ලිපියෙන් හෙළි කැරේ.

## ❊ බඩ පුරා ආහාර ගැනීම ශරීර සැපයට බාධාවක්

– තෙළහපාත ධර්මකීර්ති නා හිමි

නිවැරැදි ආහාර පරිහරණ රටාව පිළිබඳ දේශිත බුදු වදන් කිහිපයක් නූතන වෛද්‍ය මත හා පෝෂණ විද්‍යා මත සමඟ සසඳ බැලීමක් හැටියට මෙම ලිපිය සැලකිය හැකිය.

## ❊ වළගම්බා රජු දවස ඉදි වූ ගණුගල්පොත වෙහෙර

– කේ. බී. රත්නායක

'වැනසී යන බෞද්ධ උරුමය' විශේෂාංගය යටතේ – සියඹලාණ්ඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කොලොන්වින්න ග්‍රාමයේ 'වන්–තිබ්බා හෙළ' නම් වූ කඳු මුදුනේ රමණීය ස්ථානයක පිහිටි – අභාවයට යමින් පවතින – ඉපැරණි ඓතිහාසික විහාරස්ථානයක් පිළිබඳ තොරතුරු.

## ❊ The Development of Buddhist Sects

*-by Rekadahene Chandajothi Nayake Thera*

## ⁂ ථෙරී ගාථා ප්‍රකට කරන බුද්ධ කාලීන වනිතාවගේ සාමාජික පසුබිම

– නාහල්ලේ වජිරඤාණ හිමි

දහම අවබෝධ කොට රහත් ඵල ලැබූ බෞද්ධ තෙරණියන් විසින් තමන්ගේ ජීවිතය පිළිබඳ ප්‍රකාශ කර ඇතැ'යි සැලකෙන 'ථෙරී ගාථා' තුළින් හෙළිවන – බුද්ධ කාලීන භාරතයේ වනිතාවට භාරත සමාජය තුළ හිමිව තිබූ තත්ත්වය විමසා බැලීමට දරන උත්සාහයකි.

## ⁂ පුනරුත්පත්තිය විදු ඇසට පෙනෙන හැටි

– පිටිදූවේ සිරිධම්ම හිමි

බුදුදහමෙන් ප්‍රකාශිත 'සසර ගමන' පිළිබඳ අදහස තහවුරු වන විද්‍යාත්මක හා මනෝවිද්‍යාත්මක සොයා ගැනීම්. පුනරුත්පත්තිය පිළිබඳ බෞද්ධ මතය හා විද්‍යා මතය.

## ⁂ සාර්ථක යුග දිවියකට බුදුදහම ආලෝකයක්

– නිර්මලා අමරසිංහ

යුග දිවියේ සාර්ථකත්වය සඳහා දෙසූ‍ණු බුදු ඔවදන් පස්කම් සුව විඳින ගිහියාගේ ජීවිතය විධිමත් වීම සඳහා බුදු වදනෙන් ප්‍රකාශිත පිළිවෙත් මාර්ගය හෙළිදරව් කිරීමට දරන උත්සාහයකි.

## ⁂ බෞද්ධ භාවනාවේ විකාශනය

– පූඩලුගස්යායේ ධම්මදස්සි හිමි

සිත හා නුවණ දියුණු කිරීමේ උපක්‍රමයක් හැටියට – බුදු වදනෙන් ඉදිරිපත්වූ භාවනා ක්‍රම පිළිබඳ විමර්ශනයකි. භාවනා වර්ග, චරිත විශේෂතා, භාවනාවේ ප්‍රතිඵල වශයෙන් ලැබෙන ධ්‍යාන හා විදර්ශනා ඤාණ ආදිය පිළිබඳ විස්තර මෙම ලිපියට ඇතුළත්ය.

## ⁂ පොළොන්නරුැ ගල්විහාර නව අනුරුවක් සහිත මුන්දලමේ බෝධිරාජාරාමය

– ඇන්ටනි ප්‍රනාන්දු

පුත්තලම – හලාවත මාර්ගයේ මුන්දලම නගරයේ පිහිටි – දුටුවන් සිත් පහදන – අලංකාර විහාරස්ථානයක් පිළිබඳ තොරතුරු.

## ⁂ සල්ගල වන අරණ

– අනුර කුරුවිටගේ සිල්වා

'සිත් සනසන සෙනසුන' විශේෂාංගය යටතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ ගලපිටමඩ වැල්හැල්ල නම් ප්‍රදේශයේ අක්කර කීපයක් පුරා පැතිරී ගිය සොබා සුන්දරත්වයෙන් අනූන වූ වන සෙනසුනක් පිළිබඳ විස්තර.